පොදු චක්‍රලේඛ ලිපි අංක - 02 - 205 /2016

මගේ අංකය - MH/AD/01/09-01
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
2016.12.19

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්, විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන්,
රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති සියලුම රෝහල් හා ආයතන ප්‍රධානීන්.

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (බෝ නොවන රෝග) තනතුර**
**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

ඉහත සඳහන් තනතුර සඳහා මෙම නිවේදනයේ, 08 වන ඡේදය යටතේ සුදුසුකම් සපුරා ඇති සෞඛ්‍ය, පෝෂණ හා දේශීය , වෛද්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ, වෛද්‍ය නිලධාරීන්ගෙන් හා දන්ත ශල්‍ය වෛද්‍ය වරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අදාළ අයදුම්පත් මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව සකස් කොට, ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට **2016.12.30** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් මෙම අමාත්‍යාංශයේ ලේකම් හෝ වෙනත් නිලධාරියකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

03. තම අයදුම්පත්‍රය ඉල්ලා අස්කර ගැනීමට කිසිවෙකු අදහස් කරන්නේ නම් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දින සිට සති දෙකක් ඇතුළත මා වෙත දන්වා එසේ කිරීමට ඔහුට/ඇයට හැකිය. ඉල්ලුම්කරු තෝරා ගනු ලැබුවහොත් නව තනතුරට පත් කරනු ලැබේ.

04. රැකියා විස්තරය

I. බෝ නොවන රෝග විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රධාන අංශ වන බෝ නොවන රෝග, මානසික සෞඛ්‍ය, පිළිකා මර්දන ඒකකයට අදාළ සියලුම අධීක්ෂණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම.

II. බෝ නොවන රෝග විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

III. මහජන සෞඛ්‍ය සම්බන්ධ වැදගත් අංශයක් වන මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳව අමාත්‍යාංශයේ අදාළ අංශයන් දැනුවත් කිරීම හා උපදෙස් ලබා දීම.

IV. බෝ නොවන රෝග ක්ෂේත්‍රයට අයත් සියලු අංශවල කාර්යයන් පිළිබඳ සැලසුම් සකස් කිරීම.

V. අධ්‍යක්ෂ ( බෝ නොවන රෝග ), අධ්‍යක්ෂ ( පිළිකා මර්දන වැඩසටහන), අධ්‍යක්ෂ ( මානසික සෞඛ්‍ය ) යටතේ පවත්නා වැඩසටහන් මෙහෙයවීම හා ඇගයීම් කටයුතු සිදු කිරීම.

VI. බෝ නොවන රෝග විෂයය ක්ෂේත්‍රයේ කාර්යයන් සඳහා ප්‍රමාණවත් මානව, භෞතික හා මූල්‍යමය සම්පත් තිබෙන බවට වගබලා ගැනීම.

VII. ජාතික දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ අධිකාරීය පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය සහය දැක්වීම.

VIII. බෝ නොවන රෝග පාලනය සහ වැළැකීම සඳහා වන සෞඛ්‍ය පහසුකම් සාධාරණ හා සමාන ලෙස සියලු ජනතාවට ලබා දීම තහවුරු කිරීම.

IX. මෙම ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ දිරිගැන්වීම සහ ක්ෂේත්‍රයේ කටයුතු විධිමත් කිරීම සඳහා විද්‍යාත්මක පසුබිම් සකස් කිරීම.

X. ක්ෂේත්‍රයට අදාළ ජාතික හා ජාත්‍යන්තර පාර්ශවයන්ගේ සම්බන්ධීකරණය ගොඩනගා ගැනීම සහ පවත්වා ගෙන යාම.

XI. මෙම ක්ෂේත්‍රයට අදාළ මූල්‍යාධාර ලබාගත හැකි ව්‍යාපෘති හඳුනා ගැනීම.

XII. බෝ නොවන රෝග පාලනය සඳහා අවශ්‍ය වන පර්යේෂණාගාර පහසුකම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශනය සහ නිර්දේශ ලබා දීම.

XIII. මෙම අංශයේ කාර්යය මණ්ඩලයේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන පුහුණු හා ධාරිතා සංවර්ධන අවස්ථා ලබා දීම.

XIV. බෝ නොවන රෝග පාලනය සඳහා පළාත් මට්ටමින් සිදු කෙරෙන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශනය, නිර්දේශ සහ උපදෙස් ලබා දීම.

XV. බෝ නොවන රෝග, මානසික සෞඛ්‍ය හා පිළිකා රෝග ප්‍රතිකාර සේවා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික මාර්ගෝපදේශන හා නිර්දේශ ලබා දීමේදී විශේෂඥ උපදෙස් ලබා ගැනීම.

XVI. බෝ නොවන රෝග සඳහා සායනික මාර්ගෝපදේශයන් සකස් කිරීමේදී විශේෂඥ දැනුම හා කළමනාකාරිත්වයේ සහයෝගය ලබා ගැනීම.

XVII. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සහ මානසික රෝගීන් පුනරුත්ථාපනය, හෘද රෝග කළමනාකරණය සහ වකුගඩු රෝග නිවාරණය කිරීම සඳහා අවශ්‍ය වන විශේෂඥ දැනුම, උපදෙස් ලබා ගැනීම.

XVIII. බෝ නොවන රෝග, පිළිකා මර්දනය සහ මානසික සෞඛ්‍ය සම්බන්ධ කටයුතුවලදී සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝජනය කිරීම.

XIX. බෝ නොවන රෝග සම්බන්ධ තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම හා තොරතුරු සැපයීම.

XX. පැවරී ඇති ක්ෂේත්‍රය සම්බන්ධ කටයුතුවලදී නායකත්වය ලබා දීම සහ මාර්ගෝපදේශනය සැපයීම.

XXI. බෝ නොවන රෝග සම්බන්ධ වාර්ෂික සඟරාව සඳහා අවශ්‍ය මාර්ගෝපදේශන ලබා දීම.

**05. සේවා නියමයන් හා කොන්දේසි**

(අ) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගත් අයදුම්කරු රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීතින්හි viii පරිච්ඡේදයේ 97 වන රීතියට අනුකූලව එක් වර්ෂයක වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුර සඳහා පත් කරනු ලබන වෛද්‍ය නිලධාරීන් පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමිකම නොලබනු ඇත.

(ඇ) ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ 11.1.2.3 පරිදි මෙම තනතුර අවසන් සේවා ස්ථානීය තනතුරක් වශයෙන් සලකනු ලබන අතර, ස්ථාන මාරු කිරීම් කළ නොහැකිය.

**06. වැටුප් ක්‍රමය**

(අ) මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව SL-03-2016 වැටුප් ඛණ්ඩයේ පියවර 1 (රු.88,000 - 12 X 2700 – 120,400) අදාළ වේ.

(ආ) පශ්චාත් උපාධි සුදුසුකම් සහිත වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරීන්ට මසකට රු.6,000/- ක් බැගින් වූ වෛද්‍ය පරිපාලන දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) මෙම තනතුරට විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් විශේෂඥ වැටුප් හා දීමනා ලබා ගැනීමට ඔහුට/ ඇයට හිමිකම් ඇත.

**07. වයස් සීමාව**

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් වන බැවින් වයස් සීමාව අදාළ නොවේ.

**08. සුදුසුකම්**

(අ) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ, වෛද්‍ය නිලධාරීන් හෝ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් විය යුතුය.

(ආ) වෛද්‍ය පරිපාලන පිළිබඳ වෛද්‍ය විශාරද (එම්ඩී) උපාධිය හෝ විද්‍යාපති (එම්එස්සී) උපාධිය හෝ ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෛද්‍ය විශාරද (එම්ඩී) උපාධිය හෝ විද්‍යාපති (එම්එස්සී) උපාධිය යන සුදුසුකම්වලින් එකක් සපුරා තිබිය යුතුය.

සටහන :-

කෙසේ වුවද 2007.04.16 දින හෝ ඊට පෙර සිට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරු හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු දරණ නිලධාරීන්ට මෙකී අනිවාර්යය සුදුසුකම් අදාළ නොවනු ඇත.

09. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය.

(මුළු ලකුණු 50)

I. සේවා කාලය
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය සඳහා වසරකට ලකුණු 05 බැගින්

II. ඉහත 08 (ආ) හි සඳහන් මූලික සුදුසුකම්වලට අමතරව ලබා ඇති පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් (මුළු ලකුණු 15)

(අ) විද්‍යාපති (වෛද්‍ය පරිපාලන / ප්‍රජා වෛද්‍ය) - ලකුණු 10
(ආ) වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන / ප්‍රජා වෛද්‍ය) - ලකුණු 15

සටහන :-

i. 2007.04.16 දිනට පෙර ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරකට පත්ව ඇති අයදුම්කරුවන් සඳහා ඉහත ඕනෑම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

ii. පළමුවෙන් විද්‍යාපති (වෛද්‍ය පරිපාලන) පාඨමාලා ආරම්භ කළ 1996.07.01 දින හෝ ඊට පෙර ස්ථිර පදනමක් යටතේ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට පත් කරන ලද අයදුම්කරුවන්ට දැනට ක්‍රියාත්මක වන ආකාරයට උපරිම වශයෙන් ලකුණු 15ක් ලබා දෙනු ලැබේ.

III. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති (මුළු ලකුණු 15)
එක් ව්‍යාපෘතියකට ලකුණු 03 බැගින් (උපරිම ව්‍යාපෘති 05 ක් සඳහා)

IV. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සිදු කරන ලද පර්යේෂණ/ප්‍රකාශන (මුළු ලකුණු 10)
එක් පර්යේෂණ/ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් (උපරිම පර්යේෂණ/ප්‍රකාශන 05 ක් සඳහා)

සටහන :-
පශ්චාත් උපාධි සඳහා හෝ වෛද්‍ය විශාරද උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ /නිබන්ධන හෝ ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

V. සම්මුඛ පරීක්ෂණය (මුළු ලකුණු 10)

මුළු ලකුණු ප්‍රමාණය 100

10. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට හෝ ඊට ප්‍රථම ඒවා ආයතන ප්‍රධානීන් හෝ විමධ්‍යගත ඒකක / විශේෂිත ව්‍යාපාර ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

11. රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීතීන්හි I වැනි කාණ්ඩයේ ඇතුළත් කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

12. මෙම නිවේදනයේ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි,

අනුර ජයවික්‍රම
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අනුර ජයවික්‍රම
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය